**සුනාමියෙන් ගැලවී දිවි ගලවා ගත් අය සඳහා හෙපටයිටිස් ඊ (සෙංගමාලය) පිළිබඳ විශේෂ තොරතුරු**

**හෙපටයිටිස් ඊ යනු කුමක් ද?**
හෙපටයිටිස් ඊ යනු, හෙපටයිටිස් ඊ වයිරසය මගින් අක්මාවේ ඇති කරන රෝගයකි.

**හෙපටයිටිස් ඊ වයිරසය බෝවන්නේ කෙසේද?**
වයිරසය මගින් දූෂණය වූ කෑමට ගන්නා ආහාර සහ බීමට ගන්නා ජලය මගින් එම වයිරසය පැතිරේ. මේ හේතුව නිසා, වයිරසය වඩාත් පහසුවෙන් පැතිරෙන්නේ, සනීපාරක්‍ෂාව අඩු ප්‍රදේශයන්හිය.

**හෙපටයිටිස් ඊ රෝග ලක්ෂණ සහ ලකුණු මොනවාද?**
සෑම කෙනෙකුටම හෙපටයිටිස් ඊ රෝග ලක්ෂණ සහ ලකුණු පහළ නොවේ. ළමුන්ට වඩා, රෝග ලක්ෂණ ඇති වන්නේ වැඩිහිටියන්ට ය. රෝග ලක්ෂණ ඇත් නම්, ඒවා ක්‍ෂණිකව මතු වන අතර, ඒවාට උණ, මහන්සිය, ආහාර අරුචිය, ඔක්කාරය, උදරයේ අපහසුතාව, තද පැහැති මූත්‍රා, කහ උණ (ඇස් සහ සම, කහ පැහැ ගැන්වීම)අයත්ය. හෙපටයිටිස් ඊ, ගර්භණීභාවයේ අවසන් මාස තුන තුළ ,ගර්භණී කාන්තාවන්ට වඩා බරපතල ලෙස බලපායි. සාමාන්‍යයෙන් හෙපටයිටිස් ඊ සඳහා, බීජෞෂණය සඳහා කාල සීමාව දින 40කි. (පරාසය දින 15-60 දක්වා)

**ඔබට හෙපටයිටිස් ඊ වැළඳී ඇති බව දැන ගන්නේ කෙසේද?**
හෙපටයිටිස් ඊ රෝග විනිශ්චය, සාමාන්‍යයෙන් තහවුරු වන්නේ, අනෙකුත් හෙපටයිටිස් වර්ග වැළඳී නොමැති බව තහවුරු වූ පසුවත්, රෝගියාට, හෙපටයිටිස් ඊ සුලභව පවතින රටක ජීවත් ව ඇති බවට හෝ සංචාරය කර ඇති බවට ඉතිහාසයක් ඇත් නම් ය. හෙපටයිටිස් ඊ වයිරසට ඔබ අනාවරණය වී ඇතැයි සැකයක් පවතින්නේ නම්, වෘත්තියවේදී, සෞඛ්‍ය සම්බන්ධ නිලධාරියකුගෙන් විමසා බලන්න.

**හෙපටයිටිස් ඊ වළක්වා ගත හැක්කේ කෙසේද?**
ජලය බීමට ගන්නා විට එය, අනුමත කරන ලද ස්ථානයකින් ලැබෙන බවට සහතික වන්න. එමෙන්ම ආහාර අනුභවයට පෙර, ආහාර, හොඳින් සෝදා හෝ පිස ගෙන ආහාරයට ගන්න. නිතරම අත් සෝදන්න, වඩාත් ම වැසිකිළි යාමෙන් පසුවත්, ආහාර ගැනීමට පෙරත්, කුඩා දරුවකුගේ ඉණකඩ (නැපී) මාරු කිරීමෙන් පසුවත්.

හෙපටයිටිස් ඊ වයිරසය මගින්, රෝගය බෝවීම වැළැක්වීම සඳහා එන්නතක් නොමැත. ඉමියුන් ග්ලොබියුලින් (immune globulin) වලින් ප්‍රයෝජනයක් නැත.

වැඩි දුර විස්තර සඳහා, www.cdc.gov/hepatitis/ වෙබ් අඩවියට පිවිසෙන්න, එසේ නොමැති නම්, CDC හි ක්‍ෂණික, පොදු ප්‍රතිචාර දුරකථන අංක (888) 246-2675 (ඉංග්‍රීසි), (888) 246-2857 (ස්පාඤ්ඤ), හෝ (866) 874-2646 (TTY) අමතන්න



DEPARTMENT OF HEALTH AND HUMAN SERVICES
CENTERS FOR DISEASE CONTROL AND PREVENTION
SAFER • HEALTHIER • PEOPLE™